# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

සමාජ විද්‍යාව

**සමාජවිද්‍යාත්මක න්‍යාය - SOCI 28214**

තෝරාගත් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සමාජ විද්‍යා න්‍යායයේ, මූලික ලක්ෂණ හා ප්‍රභේද පැහැදිලි කර, සමාජ හැසිරීම අර්ථ නිරූපණය කිරීමට සමාජ විද්‍යාත්මක න්‍යාය භාවිත කළ හැකි ආකාරය පෙන්වන්න.

02. එමිල් දුර්කයිම් හඳුන්වා දුන් 'සමාජ කරුණු' සමාජය හැදෑරීමේදී භාවිතා කළ හැකි අන්දම විග්‍රහ කරන්න.

03. 'සමාජ ඉතිහාසය වූ කලී පන්ති සටන්වල ඉතිහාසයයි.' කාල් මාක්ස් ඉදිරිපත් කළ ඓතිහාසික භෞතිකවාදය ඇසුරින් මෙම කියමන විස්තර කරන්න.

04. කෘත්‍යවාදය පිළිබඳ මූලික හැඳින්වීමක් කර, කෘත්‍යවාදයේ සංවර්ධනයට ටැල්කොට් පාසන්ස් දැක්වූ දායකත්වය විග්‍රහ කරන්න.

05. කෘත්‍යවාදය හා සට්ටනවාදය අතර වෙනස්කම් සංසන්දනය කරන්න.

06. අන්තර්ක්‍රියාවාදයේ මූලික සංකල්ප විස්තර කර, සංකේත හා අන්තර් ක්‍රියා හරහා සමාජ යථාර්තය ගොඩ නැගෙන ආකාරය පෙන්වන්න.

07. සමාකාලීන සමාජ ගැටලු විග්‍රහ කිරීමේදී සමාජ විද්‍යා න්‍යාය භාවිත කළ හැකි ආකාරය තෝරා ගත් නිදසුන් කීපයක් මගින් විස්තර කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් තෝරාගත් මාතෘකා දෙකකට (02) සටහන් ලියන්න.

   (i) ඔගස්ට් කොම්ට්
   (ii) සමාජ ස්ථරායනය පිළිබඳ මැක්ස් වෙබර්ගේ න්‍යාය
   (iii) නවමාක්ස්වාදී චින්තකයින්
   (iv) සාර්ව සමාජ විද්‍යාව හා ක්ෂුද්‍ර සමාජ විද්‍යාව

*****************************